ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1980 අංක 60 දරන ලංකා බැංකු (සංශෝධන) පනත

---

[සභානායක සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 ජනවාරි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 35 යි　　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1980 අංක 60 දරන ලංකා බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 20/80

ලංකා බැංකු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 60 දරන ලංකා බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා බැංකු ආඥාපනතේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 397 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රාග්ධනය.

7. (1) බැංකුවේ අනුමත ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් එක් දහසක් වන්නා වූ කොටස් දශලක්ෂයකට බෙදනු ලැබූ රුපියල් කෝටි සියයක් විය යුතු ය.

(2) බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍ය වරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් විය යුතු ය.

(3) එකම කොටස්හිමියා ලෙස යම් අවස්ථාවක ආණ්ඩුව සතු වගකීම, තත්කාලයෙහි ආණ්ඩුව විසින් දරනු ලබන කොටස්වලින් නියෝජනය වන ප්‍රාග්ධනයේ මුළු ප්‍රමාණයට සීමා කරනු ලැබිය යුතු ය.".

3. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අමාත්‍යවරයා විසින් විධාන දෙනු ලැබිය හැකි බව.

33. බැංකුවෙහි කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීම මණ්ඩලයෙහි කාර්යය විය යුතු ය.".

2 -ඒ 53853—13.000 (81/01)